# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,350 - 2023 සැප්තැම්බර් මස 15 වැනි සිකුරාදා - 2023.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 914 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 915 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

913 - B 082496 — 5,403 (2023/09)
F 1 -

# පළාත් සභා නිවේදන

**සංශෝධනයයි**

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) වන වගන්තිය යටතේ වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි.

ඉහත බලතල පැවරීමට අදාළව 2022.06.24 දින අංක 2,286 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛන XIV හා උපලේඛන XV පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්. එම්. පී. ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**උපලේඛනය XIV**

**විදුහල්පති සේවය**

| *බලතල පැවරෙන නිලය* | *දැනට පැවරී ඇති බලතල* | *සංශෝධනය අනුව පවරන ලද බලතල* |
|---|---|---|
| 2. පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම් | 1. මුල් පත්වීමේ දී හෝ අන්තර්ග්‍රහණයේ දී පළාත් පාසල්වලට ස්ථානගත කිරීම.<br><br>2. පළාත් සභාව යටතේ වන පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම.<br><br>3. පළාත තුළ ස්ථාන මාරු කිරීම. | 1. මුල් පත්වීමේ දී හෝ අන්තර්ග්‍රහණයේ දී පළාත් පාසල්වලට ස්ථානගත කිරීම.<br><br>2. පළාත් සභාව යටතේ වන පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම.<br><br>3. පළාත තුළ ස්ථාන මාරු කිරීම.<br><br>4. මූලික විමර්ශන කරවීම.<br><br>5. ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ දඬුවම් පැනවීම. |

**උපලේඛනය XV**

**ගුරු සේවය**

| *බලතල පැවරෙන නිලය* | *පැවරී ඇති බලතල* | *සංශෝධනය අනුව පවරන ලද බලතල* |
|---|---|---|
| 2. පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම් | 1. මුල් පත්වීමේ දී ස්ථානගත කිරීම. | 1. මුල් පත්වීමේ දී ස්ථානගත කිරීම.<br><br>2. මූලික විමර්ශන කරවීම.<br><br>3. ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ දඬුවම් පැනවීම. |

09-245

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## උතුරු මැද පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල හා දෙමළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023

උතුරු මැද පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2023.10.13** වේ.

විෂයයන් සඳහා සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරා ගැනීමට නොහැකි වුවහොත් පමණක්, උතුරු මැද පළාතේ අවම වශයෙන් වසර 10 ක් සේවය කිරීමට යටත් ව දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචිය, ඡන්ද හිමි නාමලේඛනය හෝ ග්‍රාම නිලධාරි සහතික මගින් සනාථ කළ යුතුය.

01. සිංහල හා දෙමළ මාධ්‍ය සඳහා පළාත් පදනමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තරග විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙළ අනුව පවතින එක් එක් විෂයයේ පුරප්පාඩු සංඛ්‍යාවට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදුකෙරේ. පවතින ප්‍රතිපාදන ප්‍රමාණය හා සේවා අවශ්‍යතාව මත පදනම්ව 2023.06.30 දින දක්වා පැවති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ. (පුරප්පාඩු ලේඛනය උපලේඛන 02 හි දැක්වේ.)

02. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (iv) හි GE-01-2016 A කාණ්ඩය (මාසික රු. 31,490-6 x 445-7 x 525-2 x 600- රු. 39,035ක්) වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රුපියල් 37,835 වැටුපෙ හි පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

3.1 *අධ්‍යාපන සුදුසුකම් :-*

i. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ, උපලේඛන 01 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබීම,

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් සහිතව විෂයයන් 06 කින් එකවර සමත් ව සම්මාන 03 ක් ලබා තිබිය යුතු ය.

***ඉතා වැදගත්.-*** ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් කරුණු සැළකිල්ලට ගත යුතු ය.

* ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.

* උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.

* ඉල්ලුම් කළ විෂයය/විෂයයන් කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3.2 *කායික හා මානසික යෝග්‍යතාව :*

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*3.3 වයස ඃ*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

*3.4 වෙනත් සුදුසුකම් ඃ*

i. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

iii. උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.

iv. අයදුම්කරු හෝ කලත්‍රයා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වසර 03කට නොඅඩු කාලයක් උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

04. සේවා කොන්දේසි ඃ-

4.1 පත්වීම් ලබන පාසලේ වසර 05 ක් හා එම පාසල අයිති අධ්‍යාපන කොට්ඨාසයේ පාසල්වල තවත් වසර 02 ක් සේවය කළ යුතු ය. පත්වීම් ලබන පාසලේ හා එම කොට්ඨාසය තුළ වසර 07 ක සේවා කාලයකින් පසුව පමණක් පත්වීම්ලාභියාට ස්ථාන මාරු සඳහා අයදුම් කළ හැකි ය.

4.2 රාජ්‍ය /පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත් ව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ (1) (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.3 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

4.4 විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරියේ දී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූල විය යුතුය.

4.5 මෙම තනතුරට පත්වන අපේක්ෂකයින් වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

4.6 ගුරු සේවයේ උසස්වීම් උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදුකරනු ඇත.

4.7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා 2020.10.16 දිනැතිව සිදුකළ සංශෝධන මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි දෙවන භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

05. බඳවා ගැනීම ඃ

*5.1 බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

i. 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

ii. තෝරා ගැනීම සඳහා ලිඛිත විභාගයක් පවත්වනු ලබන අතර, පළාත තුළ එක් එක් විෂයයන් සඳහා පවතින පුරප්පාඩු හා සසඳන විට ලිඛිත විභාගයේ දී ලබාගන්නා ඉහළම ලකුණු අනුපිළිවෙළ අනුව අයදුම්කරුවන් තුන් ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

iii. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා එදින ම ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ.

iv. ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලැබූ සහ මෙහි 3 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

5.2 *ලිඛිත තරග විභාගය* ඃ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු* | *සුදුසුකම් ලැබීම සඳහා ලබාගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනුම | | | |

*විෂය නිර්දේශය :*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය :

* මෙම ප්‍රශ්න පත්‍රය සැලසුම් කර ඇත්තේ අපේක්ෂකයාගේ ගුරු වෘත්තියට හා දැනුමට අදාළ කුසලතා හා තාර්කික බුද්ධිය මැන බැලීම සඳහාය. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු ආකාරයේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබා දිය යුතුය.

*විෂය අංක 02 - සාමාන්‍ය දැනුම :*

* ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන බහුවරණ හා කෙටි පිළිතුරු ආකාරයේ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.
* සිදුවී ඇති/සිදුවෙමින් පවතින අධ්‍යාපනික සංවර්ධනයෙ හි ප්‍රවණතා පිළිබඳ ඉගැන්වීම සහ/හෝ සාමාන්‍ය දැනුම, අධ්‍යාපන නවීකරණය පිළිබඳ දේශීය හා සාමාන්‍ය දැනුම අන්තර්ගත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලබා දිය යුතුය.

*5.3 විභාග පටිපාටිය :*

* මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.
* සෑම අයදුම්කරුවෙකු ම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එක් භාෂාවකින් පමණක් මුහුණ දිය යුතුය. පත්වීම් ලබාදීම විභාගයට පෙනී සිටි භාෂාව අනුව සිදුකෙරේ.
* කිසිදු අයදුම්කරුවෙකුට ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රයේ සඳහන් භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
* සෑම අයදුම්කරුවෙකු ම ප්‍රශ්න පත්‍ර දෙකට ම (02) පෙනී සිටිය යුතුය.
* බඳවා ගන්නා ප්‍රමාණය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

*5.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

* සේවා ව්‍යවස්ථාවට අනුකූලව *ගැසට් පත්‍රය* හෝ පුවත්පත් දැන්වීමක හෝ වෙබ් අඩවියේ පළකරන ලද සහ එහි දක්වා ඇති සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලැබේ.

*5.5 ප්‍රායෝගික පරීක්ෂණය :*

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ඨ වීම | 05 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 |
| 04 | කාල කළමනාකරණය | 05 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | **25** |

*5.6 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමය :*

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මිනිත්තු පහකට (05) නොඉක්මවන කාලයක් ලබාදෙනු ඇත.
ii. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව විසිපහ (25) කි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.
iv. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ප්‍රායෝගික පරීක්ෂණය ඇගයීමට ලක් කෙරේ.

*5.7 නිර්ණායකවල අරමුණු :*

i. අරමුණ හා ප්‍රවිෂ්ඨ වීම :
පාඩමේ අරමුණු සාර්ථක ව පැහැදිලි කිරීමට ඇති හැකියාව සහ ප්‍රවේශ වීමට ඇති හැකියාව ඇගයීම.

ii. පෞරුෂය හා හඬ පාලනය :
අයදුම්කරු සතුව ගුරුවරයෙකුට ගැලපෙන හොඳ පෞරුෂයක් සහ කටහඬ පාලනය කිරීමේ හැකියාව තිබේද යන්න ඇගයීම.

iii. සන්නිවේදනයේ පැහැදිලි බව :
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ අදාළ ගැටළු ඵලාදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

iv. කාල කළමනාකරණය :
නියමිත කාල සීමාව තුළ ඉලක්කය කරා ළඟා වීමේ හැකියාව ඇගයීම.

v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය :
ඉල්ලකය කරා ළඟා වීමට ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම හොඳින් භාවිත කිරීමේ හැකියාව ඇගයීම.

06. *විභාග ගාස්තු :*

6.1 විභාග ගාස්තුව රු. 720.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට උතුරු මැද පළාත් සභාවේ ගිණුම් අංක අංක 2003.02.13 ට බැර වන ලෙස ගෙවිය යුතුය. ඒ සඳහා නිකුත් කරන එන්සී 100 රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (රිසිට්පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය) විභාග ගාස්තු ගෙවීම සඳහා ඉහත නියම කර ඇති දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර පිට පළාත් කාර්යාල හෝ බැංකු හෝ තැපැල් කාර්යාලවලට ගෙවන ලද හෝ නියමිත දිනට පසුව ගෙවන ලද රිසිට්පත් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 *විභාග මධ්‍යස්ථාන* - මෙම විභාගය පහත දැක්වෙන නගරයේ දී පවත්වනු ලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අනුරාධපුරය | 01 |

07. *අයදුම් කිරීමේ ක්‍රමය :*

7.1 අයදුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව අපේක්ෂකයා විසින් කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. 01 සිට 04 තෙක් ශීර්ෂ පළමු පිටුවේ ද, 05 සිට 07 දක්වා දෙවන පිටුවේ ද, ඉතිරි ශීර්ෂ තෙවන පිටුවේ ද වන පරිදි අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය.

7.2 නියමිත සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා නියමිත ආකෘතියට අනුකූලව සකස් නොකළ, අසම්පූර්ණ, නියමිත පරිදි විභාග ගාස්තු නොගෙවූ සහ නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීම සඳහා ඉඩ දෙනු නොලැබේ. ඒ සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීමක් සිදු නොකෙරේ.

7.3 සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 අයදුම් කරනු ලබන විෂයය/විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

7.5 අයදුම්කරු එක් විෂයයකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එය ප්‍රමුඛතාගත කර අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

7.6 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය අයදුම්පත්‍රය අනිවාර්යයෙන් ම තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, මෙම පත්වීම සඳහා සුදුස්සෙකු වශයෙන් තේරී පත්වුවහොත් එම ආයතනයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සහතික කරවා ගත යුතුය.

7.7 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

7.8 නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2023.10.13** දින හෝ ඊට පෙර ලැබෙන සේ ''**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2023**'' ලෙස හා ''ඉල්ලුම් කරන විෂය'' අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

7.9 තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේ දී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව වූ කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

7.10 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

08. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින විභාගයේ දී, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත ලේඛන වලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රය

09. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයන්ට ඉඩ දෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර නොමැති වීම මත යම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් ඒවා පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවන් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට සිදුවිය හැක.

10. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත උතුරු

මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලයීය වෙබ් අඩවියේ (**psc.nc.gov.lk**) නිවේදනයක් පළකරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය හෝ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 3කට පෙර කැඳවීම් ලිපිය නොලැබිණි නම් ඒ බව වහාම ''ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුරය'' යන ලිපිනයට දැන්විය යුතුය. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

i. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
ii. සේවා ස්ථානයේ ලිපිනය :
iii. ජාතික හැඳුනුම්පත් අංකය :
iv. දුරකතන අංකය :

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය නොවන හෝ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

12. මෙම විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම, කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන්ම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ඇමුණුම 01

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**උතුරු මැද පළාතේ පළාත් සහා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**

| *ඉල්ලුම් කරන විෂයය අංකය* | *ඉල්ලුම් කරන විෂයය* | *ප්‍රමුඛතාවය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

(පුරප්පාඩු ලේඛනය අනුව සම්පූර්ණ කරන්න. ඉහළම ප්‍රමුඛතාවය අංක 01 ලෙස හා ඊට අනුව ඊළඟ ප්‍රමුඛතා අංක ඇතුළත් කරන්න.)

පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය - සිංහල : ☐ දෙමළ : ☐

ස්ථිර පදිංචි පළාත :........................................... දිස්ත්‍රික්කය :...........................................

1. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා.- PERERA A. B.) :- ...............................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..............................................
..............................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..............................................
..............................................

2. වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..............................................
..............................................
..............................................

2.1 ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................................

2.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..............................................

3. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය :

3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.3 2023.10.13 දිනට වයස : අවුරුදු : මාස : දින :

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය :..............................................

3.5 විවාහක/අවිවාහක බව :..............................................

3.6 දුරකථන අංකය :

4. හදාරා ඇති උපාධිය පිළිබඳ විස්තර :

4.1 උපාධි පාඨමාලාවේ නම :..............................................
4.2 භාෂා මාධ්‍යය :..............................................
4.3 විශ්වවිද්‍යාලයේ හෝ අදාළ ආයතනයේ නම :..............................................
4.4 උපාධිය වලංගු දිනය :..............................................
4.5 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් (ඉංග්‍රීසි අකුරින්) :..............................................
(උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

5. 5.1 අ.පො. ස. (උ. පෙළ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින් ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

5.2 විභාග අංකය හා වර්ෂය.-

| *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

6. අ.පො. ස. (සා. පෙළ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින් ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතු ය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

6.1 පළමුවර ඃ

විභාග වර්ෂය ඃ........................................ විභාග අංකය ඃ............................................

| *අනු. අංකය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

(වෛකල්පික විෂයයන් ඇතුළත් නොකළ යුතු ය.)

7. *අයදුම්කරුගේ සහතිකය ඃ*

7.1 මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගුවන බව පිළිගනිමි.

7.2 මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව හෝ නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමට යටත්වන බව දනිමි.

7.3 මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

7.4 ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු කුසලතාවය ඉල්ලුම්කර ඇති පාසල් සඳහා පත්කිරීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවක පළාත තුළ ඕනෑම පාසලක් සඳහා පත්වීම ලබා ගැනීමට එකඟ වෙමි./නොවෙමි.

දිනය ඃ........................ ...............................................

අයදුම්කරුගේ අත්සන.

8. මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න.

8.1 මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඃ..................................................................
8.2 ගෙවූ දිනය ඃ..........................................................................................................
8.3 කුවිතාන්සි අංකය ඃ.................................................................................................

| |
|---|
| විභාග ගාස්තුව ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

9. *අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ..................................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ........................................... දින මා ඉදිරියේ දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

..........................................................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය ඃ...................................................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ...................................................................................
තනතුර ඃ...................................................................................
ලිපිනය ඃ...................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

10. අයදුම්කරු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරුවන...........................................................................................................මයා/මිය/මෙනෙවිය දනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ.............................................................................................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම තනතුරින් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.......................................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන (නිලමුද්‍රාව).

නම :........................................................................................
තනතුර :....................................................................................
ලිපිනය :...................................................................................
දිනය :......................................................................................

**උපලේඛනය - 01 (අධ්‍යාපන සුදුසුකම්)**

| සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය | | |
|---|---|---|
| උසස් පෙළ | රසායන විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් හෝ රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | භෞතික විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක භෞතික විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් හෝ භෞතික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ජීව විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව/ජීව විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව/ජීව විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී පහත විෂයයන් 03 එක්වරක දී සමත් වී තිබිය යුතුය.<br>1. භෞතික විද්‍යාව<br>2. රසායන විද්‍යාව<br>3. ජීව විද්‍යාව/උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව යන විෂයයන්වලින් එක් විෂයයක් |
| | කෘෂි විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂි විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ කෘෂි විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br>අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත විෂයයන් 03 එක් වරක දී සමත් වී තිබිය යුතුය.<br>1. භෞතික විද්‍යාව<br>2. රාසායන විද්‍යාව<br>3. කෘෂි විද්‍යාව |
| | සංයුක්ත ගණිතය | පිළිගත් විශ්වවිද්‍යාලයක ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය පිළිබඳ විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ඉංජිනේරු තාක්ෂණවේදය | පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව/සිවිල් /විදුලි/ඉලෙක්ට්‍රෝනික/යාන්ත්‍රික) විෂයයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිව් අවුරුදු පාඨමාලාව (ඉදිකිරීම්) (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (ඉදිකිරීම්) (NDEC) හෝ ඉදිකිරීම් පිළිබඳව උසස් ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (සිවිල්) (HNDE) ලබා තිබීම. |
| | ජෛව පද්ධති තාක්ෂණවේදය | පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂි විද්‍යාව විෂයයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය/භෞතික විද්‍යාව/රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |

උපලේඛනය - 01 (ඉතිරි)

| සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය | | |
|---|---|---|
| උසස් පෙළ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. |
| | ජපන් | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජපන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. |

**13 වසරක සහතික කරන ලද අධ්‍යයන වැඩසටහන (වෘත්තීය විෂය ධාරාව) සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්**

| *අනු. අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 01 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය child Phychology and care | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් හෝ ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 02 | Health and Social Care සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධිය හෝ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් |
| 03 | Performing Arts ප්‍රාසංගික කලාව | ප්‍රාසංගික කලා පිළිබඳ විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රාසංගික කලා උපාධිය හෝ නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ප්‍රසංගික කලාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 04 | Event Management කාර්ය සිද්ධි කළමණාකරනය | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමණාකරන උපාධිය හෝ කාර්ය සිද්ධි කළමණාකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 05 | Arts and crafts ශිල්ප කලා | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර කලාව) හෝ දෘෂ්‍ය කලා හා සැලසුම්කරණය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ දෘෂ්‍ය හා තාක්ෂණික කලා උපාධිය හෝ ලලිත කලාවේදී උපාධිය හෝ ශිල්ප කලා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 06 | Interior Designing අභ්‍යන්තර නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 07 | Fashion Designing විලාසිතා නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය හෝ දෘෂ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම්, කලා) හෝ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය හෝ විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 08 | Graphic Designing ග්‍රැෆික් නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඇතුළත් උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 09. | Landscaping භූ දර්ශන නිර්මාණකරණය | කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව, භූ දර්ශන පිළිබඳ ප්‍රථම උපාධිය හෝ භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය |
| 10 | Applied Horticultural Studies ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂිකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය |

| *අනු. අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 11 | Livestock Product Studies<br>පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (සත්ත්ව විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සත්ත්ව පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය |
| 12 | Food Processing Studies<br>ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ආහාර විද්‍යාව හා තාක්ෂණ විශේෂීකරණය සහිතව) හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදී උපාධිය |
| 13 | Plantation Product Studies<br>වැවිලි හෝ නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ අපනයන කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 14 | Construction Studies<br>ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 15 | Automobile Studies<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 16 | Electrical and Electronic Studies<br>විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 17 | Textile and Apparel Studies<br>පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 18 | Metal Fabrication Studies<br>ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 19 | Aluminium Fabrication Studies<br>ඇළුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ තාක්ෂණවේදී උපාධිය සිවිල් (ඉදිකිරීම්) හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 20 | Computer Hardware and Networking (Web Designing and Software Development)<br>පරිගණක දෘඪාංග හා ජාලකරණය (වෙබ් නිර්මාණය හා මෘදුකාංග සංවර්ධනය) | පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂයය හෝ පරිගණක විද්‍යාව ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ මෘදුකාංග සංවර්ධනය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක්. |
| 21 | Manufacturing (නිෂ්පාදනය) | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් |

| අනු. අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 22 | Tourism and Hospitality<br>සංචරණය හා ආගන්තුක සත්කාර | ආගන්තුක සත්කාර හා විවේක කළමණාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාවේදී සංචාරක කළමනාකරණය විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණය උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| **වෙනත්** | | |
| 23 | විශේෂ අධ්‍යාපනය | පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම උපාධියක් ලබා තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ඕනෑම උසස් අධ්‍යාපන ආයතනය විශේෂ අධ්‍යාපනය පිළිබඳ එක් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම. |

**උපලේඛනය 02**

**ගුරු පුරප්පාඩු ලේඛනය**

| විෂය කේත අංකය | විෂය | උතුරු මැද පළාත | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| 1 | රසායන විද්‍යාව | - | 2 | - |
| 2 | භෞතික විද්‍යාව | 12 | 4 | - |
| 3 | ජීව විද්‍යාව | 5 | 2 | - |
| 4 | කෘෂි විද්‍යාව | 2 | - | - |
| 5 | සංයුක්ත ගණිතය | 4 | 2 | - |
| 6 | ඉංජිනේරු තාක්ෂණවේදය | 2 | 1 | - |
| 7 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 6 | 1 | - |
| 8 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 11 | 3 | - |
| 9 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | - | 3 | - |
| 10 | ජපන් | 1 | - | - |
| 11 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | 3 | - | - |
| 12 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | 1 | - | - |
| 13 | ප්‍රසාංගික කලාව | 1 | - | - |
| 14 | කාර්ය සිද්ධි කළමනාකරණය | 4 | - | - |
| 15 | ශිල්ප කලා | 2 | - | - |
| 16 | අභ්‍යන්තර නිර්මාණකරණය | 2 | - | - |

| *විෂය කේත අංකය* | *විෂය* | *උතුරු මැද පළාත* | | |
|---|---|---|---|---|
| | | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* | *ඉංග්‍රීසි මාධ්‍ය* |
| 17 | විලාසිතා නිර්මාණකරණය | 5 | - | - |
| 18 | ග්‍රැෆික් නිර්මාණකරණය | 3 | - | - |
| 19 | භූ දර්ශන නිර්මාණකරණය | 3 | - | - |
| 20 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | 3 | - | - |
| 21 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 4 | - | - |
| 22 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 10 | - | - |
| 23 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 1 | - | - |
| 24 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | 13 | - | - |
| 25 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | 9 | - | - |
| 26. | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | 8 | 1 | - |
| 27. | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | 4 | - | - |
| 28. | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | 4 | - | - |
| 29. | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | 6 | - | - |
| 30. | පරිගණක දෘඩාංග සහ ජාලකරණය | 8 | - | - |
| 31 | නිෂ්පාදනය | 2 | - | - |
| 32 | සංචරණය හා ආගන්තුක සත්කාර | 8 | 1 | - |
| 33 | විශේෂ අධ්‍යාපනය | 25 | 2 | - |
| | එකතුව | 172 | 22 | 0 |

09-300